**ගම්පොළ නගර සභාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගම්පොළ නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගම්පොළ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශේෂ පත්‍ර දිනට අවසන් වී නොමැති නඩු 09 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

#### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.1,185,087 ක අවස්ථා 06 කට අදාළ කර්මාන්ත අතරුදවුම් මුදල්, මුද්දර ගාස්තු රු.91,576 ක් හා රු.41,500 ක ටෙන්ඩර් තැන්පත් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු රු.118,150 ක යන්ත්‍ර හා උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ රු.44,240 කට මිලදී ගෙන තිබුණු වානේ අල්මාරියක් තෙවරක් ගිණුම්ගත කිරීමෙන් රු.88,480 ක් වැඩියෙන් දැක්විණි. | -එම- | -එම- |

#### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂ හා ඒවාට අදාළ උපලේඛනවල ශේෂ සමඟ සැසඳීමේදී රු.44,808,405 ක වෙනසක් පැවතුණි. | වෙනස සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වර්ෂයේ අවසාන දිනට පැවති ගිණුම් අයිතම 03 ක එකතුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ සමඟ සැසඳීමේදී රු.26,270,746 ක වෙනසක් පැවතුණි. | වෙනස සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 164 වගන්තිය | සභාව සතු තානායමේ 2019 – 2021 කාලපරිච්ඡේදයට අදාළ හිඟ කළමනාකරණ ගාස්තුව අයකරගෙන නොතිබුණි. | හිඟ නොගෙවීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් කමිටුව වෙත යොමු කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 (3) වගන්තිය | 2016 - 2020 කාලයට අදාළ කාලය ඉකුත් වූ තැන්පත් 17 ක් නියාදනය කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 5 වගන්තිය | වෙළඳ සංකීර්ණ 06 ක කඩ කාමර 177 ක කඩ කුලී තක්සේරු නොකර 2007 ඔක්තෝබර් 02 දිනැති තක්සේරුව අනුව කුලී අයකර තිබුණි. | නව තක්සේරුව ලද පසුව කුලී අයකර ගැනීමට කටයුතු කරන බව. | තක්සේරු කර කුලී අයකළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.68,793,142 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.73,847,288 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 30,050,000 | 32,818,035 | 33,679,146 | 61,338,062 | 30,000,000 | 32,744,600 | 28,279,792 | 62,199,173 |
| (ii) | කුලී | 25,895,000 | 24,894,465 | 31,399,143 | 85,091,101 | 24,595,000 | 18,256,184 | 11,470,945 | 91,595,779 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,150,000 | 4,179,517 | 4,283,422 | 1,237,412 | 4,450,000 | 3,465,176 | 2,546,113 | 1,341,317 |
| (iv) | වෙනත් ආදායම් | 50,000,000 | 49,384,242 | 39,847,868 | 49,740,237 | 51,500,000 | 38,705,614 | 36,988,288 | 40,203,864 |
| | | 111,095,000 | 111,276,259 | 109,209,579 | 197,406,812 | 110,545,000 | 93,171,574 | 79,285,138 | 195,340,133 |

## 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.61,338,062 ක් වූ අතර, ඒකකයක වරිපනම් බදු හිඟය රු.10,000 ඉක්මවූ වරිපනම් ඒකක 1549 කින් එකතුව රු.36,652,736 ක් විය. | දේපල තහනම මඟින් අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කළ යුතුය. |
| **(ආ) කඩ කුලී** | | |
| (i) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කුලී ශේෂය රු.76,914,939 ක් වූ අතර, රු.100,000 ඉක්මවූ හිඟ කඩ කාමර කුලී අවස්ථා 18 කට අදාළ හිඟය රු.9,005,039 ක් විය. | සංශෝධනය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බව හා හිඟ කඩ කුලී සම්බන්ධ මුද්‍රා තැබීමේ නිවේදන නිකුත් කිරීමට කටයුතු කරන බව. | හිඟ කඩ කුලී අයකළ යුතුය. |
| (ii) පොදු වෙළඳපොල සංකීර්ණයේ කඩ කාමර 91 ක් මෙතෙක් ටෙන්ඩර් කර නොතිබූ අතර, ටෙන්ඩර් කර ඇති කඩ කාමර 105 අතරින් කඩ කාමර 78 ක් ගිවිසුම්ගත වීමකින් තොරව අවිධිමත්ව ව්‍යාපාර පවත්වාගෙන යාමට ඉඩසලසා තිබුණි. | නව තක්සේරුව ලද පසු ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බව. | ටෙන්ඩර් කර ආදායම් රැස්කළ යුතු බව. |

## 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.39,460,000 ක් විය. | මෙතෙක් ලැබී නොමැති බව. | වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෛනිකව එකතු කරන ලද කසළ කුණ්ඩසාලේ කාබනික පොහොර අංගනයට ලබා දීමට හැකියාව තිබියදී ඊට වඩා කි.මී. 82 ක් පමණ දුරින් පිහිටි දඹුල්ල දිගම්පතන කසළ මධ්‍යස්ථානයට ලබා දී තිබුණු අතර ඒ වෙනුවෙන් ප්‍රවාහන වියදම් වශයෙන් රු.3,125,133 ක් සමාලෝචිත වර්ෂය තුළ වැයකර තිබුණි. | කසළ ප්‍රමාණය වැඩි වීම හා කුණ්ඩාසාලේ ප්‍රවාහනය දුෂ්කර වී ඇති බව. | ප්‍රවාහන වියදම් අවම කරගත යුතුයි. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එකතුවන නොදිරන කසළ එකතු කිරීම හෝ බැහැර කරලීම සඳහා ද විධිමත් වැඩපිළිවෙලක් නොතිබූ අතර, පරිසරයට හානිදායක අයුරින් මුදාහැර තිබුණි. | නොදිරන කසළ එක්රැස් කිරීමට තීරණය කර ඇති බව. | නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.17,473,100 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.12,073,861 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.3,849,644 ක් විය. | කපා හැරීමට හා අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂ අය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.49,825,195 ක් වූ අතර ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ශේෂ එකතුව රු.3,786,706 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.4,330,196 ක් විය. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඇ) | 2011 වර්ෂයේ සිට පැවති රු.225,000 ක අත්තිකාරම් ශේෂයක් පියවීමට කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණයේ අවසන් තීරණය ලැබුණු පසු පියවීමට හා අනුමැතිය ලැබු පසු පියවීමට කටයුතු කරන බව. | අත්තිකාරම් පියවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2004 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලයට අදාළව රු.563,753 ක නිකුත් කරන ලද පසුව අගරු වූ චෙක්පත් 28 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති රු.6,832,225,558 ක ඉඩම් හා ගොඩනැගිලි සඳහා තක්සේරු වාර්තා හා වෙනත් නීත්‍යානුකූල ලියවිලි ඉදිරිපත් නොකෙරුණි. | වත්කම් තක්සේරු කිරීමට කටයුතු කරන බව. | තක්සේරු වාර්තා ලබා ගැනීමට හා නීත්‍යානුකූල ලියවිලි ඉදිරිපත් කළ යුතුය. |
| (ඊ) | ට්‍රැක්ටරයක්, මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර ඇතත්, භෞතිකව නොතිබුණු රු.225,000 ක ට්‍රැක්ටරය පිළිබඳ සොයා බලා කටයුතු කර නොතිබුණි. | දැනට මෙවැනි ට්‍රේලරයක් නොමැති බව. | ආයතනය සතු වත්කම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.9,041,373 ක වාහන 03 ක් හා රු.613,800 ක ට්‍රේලර් 04 ක් වසර 01 ත් 07 ත් අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි. | ඉදිරියේදී වෙන්දේසි කිරීමට හා අලුත්වැඩියා කිරීමට කටයුතු කරන බව. | අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2005 වර්ෂයේ දී දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබා ගන්නා ලද රු.96,366,315 ක ණය මුදලක් යොදවා මහල් 03 කින් ගම්පොළ පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට සැලසුම් කර තිබුණ ද මහල් 02 ක් පමණක් ඉදිකර තිබුණු අතර එහි කඩ කාමර 197 ක් පැවතුණි. මෙම කඩ කාමර වලින් කඩ කාමර 100 කට ආසන්න ප්‍රමාණයක් වසර 17 ක කාලයක සිට ව්‍යාපාරික කටයුතු කිරීමකින් තොරව වසා දමා තිබුණි. | තක්සේරුකර වෙත යොමුකර ඇති අතර පසුව ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බව. | ටෙන්ඩර් කර ආදායම් උපයාගත යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පරිසර අධිකාරියට අයත් සභාව භාවිතා කරන බොබ්කැට් යන්ත්‍රයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ කිසිදු ලේඛනයක් සභාව සතුව නොමැති බව. | කරුණු සොයා බලා පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.5 අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විගුලවත්ත පිහිටි සභාව සතු ඉඩම 2003 අප්‍රේල් 28 දින සිට වසර 30 ක කාලයක් සඳහා ගම්පොළ මලල ක්‍රීඩා සමාජයට බදු දී ඇති අතර එකී බදු ගැනුම්කරු විසින් නගර සභාවේ අවසරයකින් තොරව ඉඩමේ කොටසක් වෙනත් පාර්ශවයකට විකුණා තිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග සඳහා පළාත් පාලන කොමසාරිස්ගෙන් උපදෙස් ලබා ගන්නා බව. | සභාව සතු දේපලවල ආරක්ෂාව හා අයිතිය තහවුරු කළ යුතුය. |
| (ආ) | ගම්පොළ ශ්‍රී ලංගම බස් නැවතුම්පොල සාප්පු සංකීර්ණය 2001 ජනවාරි 10 දින සිට වසර 30 කට පෞද්ගලික පාර්ශවයකට බදු දී තිබූ අතර එකී බදුකරු විසින් කඩ කාමර 42 ක් අනවසරයෙන් ඉදිකර ජලය හා විදුලිය ඔහු විසින්ම ලබාගෙන නඩත්තු කරමින් පැවතුණි. එසේම 2001 ජනවාරි 10 දින සිට සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා කාලය තුළ රු.4,513,416 ක බදු කුලී අයකරගෙන ද නොතිබුණි. | තක්සේරුව ලද පසු ඉදිරි කටයුතු සිදුකරන බව. | අනවසර ක්‍රියාකාරකම් ඉවත් කර නීත්‍යානුකූලව කටයුතු කළ යුතු අතර හිඟ ආදායම් අයකළ යුතුය. |
| (ඇ) | ජයරත්න මාවත වෙළඳ සංකීර්ණය 2002 වර්ෂයේ පෞද්ගලික සමාගමකට බදු දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.10,482,882 ක් කඩ කුලී අයකරගෙන නොතිබුණි. | නීතිඥ මහතුන් හරහා උසාවියට දැනුම් දී ඇති බව. | හිඟ කුලී අයකර ගත යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| (i) | අනුමත හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 21 ක පුරප්පාඩු 64 ක් පැවතුණි. | පළාත් පාලන කොමසාරිස් කාර්යාලය දැනුවත් කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| (ii) | 2014 නොවැම්බර් 24 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව බඳවාගත් සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන් 13 දෙනෙකු කාර්යාල කටයුතු සඳහා යොදවාගෙන තිබුණි. | වසර ගණනාවක සිට මේ ආකාරයෙන් සේවයේ යොදවා ඇති බව. | තනතුරට අදාළ රාජකාරිය පැවරිය යුතුය. |

**(ආ) සේවක ණය**

| | | |
|---|---|---|
| 2010 සිට 2022 දක්වා කාල පරාසය තුළ විශ්‍රාම ගිය, ස්ථාන මාරු වී ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් හා සේවකයින් 41 දෙනෙකුගෙන් එකතුව රු.2,529,760 ක ණය ශේෂයක් අයකර ගෙන නොතිබුණි. | ණය මුදලෙන් කොටසක් අයකර ගත් බව. | ණය ශේෂ අයකර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයේ දැක්වෙන ඇස්තමේන්තුගත ආදායම් වියදම් සඳහා තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයන් 36 ක සියයට 52 සිට සියයට 100 දක්වාද, වියදම් විෂයයන් 23 ක සියයට 35 සිට සියයට 98 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | ඉදිරියේදී විචලයන් අවම වන පරිදි අයවැය ලේඛනය පිළියල කරන බව. | අවධානයෙන් හා අවශ්‍යතාවය සලකා අයවැය පිළියෙල යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණකගේ විගණන කාර්යට අමතරව වෙනත් විෂය රාජකාරී පවරා තිබීම හේතුවෙන් විගණන කටයුතු ස්වාධීනව හා ඵලදායීව ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | අමතර රාජකාරී වලින් කොටසක් මේ වන විට ඉවත් කර ඇති බව. | අභ්‍යන්තර විගණන රාජකාරී කටයුතු පමණක් පැවරිය යුතුය. |

### 4.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |